# දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

*වැටුප් කේත අංකය : -* ***MN-03-2016***

# දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන :

1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
යොමු අංකය :GMA/SOR/ MN - 03 දිනය : 2016.02.11

1.2 අමාත්‍යාංශය : ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
යොමු අංකය : MT/03/02/04/2 දිනය : 2016.02.24

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :
යොමු අංකය : DMS/F2/DR/01 දිනය : 2013.04.09
DMS/1142 2014.04.30

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-2/REC/02/1287 දිනය : 2016.01.19

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NPC/03/43/1/SR-2-ii දිනය : 2016.01.13

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය :PSC/EST/04-01-43/02/2016 දිනය :2017.09.12

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද දුම්රිය සාමාන්‍යාධිකාරී

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන

3.2 ශ්‍රේණි : III, II , I

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ විධායකය විසින් නිශ්චිත කොට පවරනු ලබන පිරිස් පාලනය, මුදල් භාරකාරිත්වය හා මුදල් පරිහරනය අධීක්ෂණය හා මෙහෙයුම් යන කාර්යයන් ඇතුළත් බහුකාර්ය (Multi Functional) ස්වරූපයේ කාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැකිය.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.)

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : MN 3 – 2016

5.2 වැටුප් පරිමාණය : රු.31,040-10 x 445–11 x 660–10 x 730–10 x 750–57,550

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය රු. |
|---|---|---|
| III | පියවර 01 | 31,040 |
| II | පියවර 12 | 36,150 |
| I | පියවර 23 | 43,480 |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| උපදේශක | III, II, I | 17 | • පූර්ණ කාලීන ආධුනිකයින්ගේ න්‍යායික / ප්‍රායෝගික පන්ති පැවැත්වීම , විභාග පැවත්වීම , ඔවුන්ගේ විභාග ප්‍රතිඵල , පාඨමාලා තොරතුරු, නිවාඩු පිළිබඳව ලිපිගොනු පවත්වාගෙන යාම.<br>• දුම්රිය තාක්ෂණික කළමණාකරන සහකාර හා දුම්රිය කාර්මික කළමණාකරන සහකාර ශිල්පින්ට කාර්මික පුහුණු පාඨමාලා සැකසීම හා පැවැත්වීම, ඔවුන්ගේ වෘත්තීය පරීක්ෂන සඳහා දායක වීම.<br>• දුම්රිය එන්ජින් රියදුරු / නියාමක ශ්‍රේණිවලට දුම්රිය තාක්ෂණය පිළිබඳව විශේෂ පාඨමාලා පැවැත්වීම.<br>• අනෙකුත් උප දෙපාර්තමේන්තු සඳහා පර්යේෂනාත්මක / නිර්මානශිලි කාර්යයන් ඉටු කිරිම.<br>• වාර්ෂික පාඨමාලා ද්‍රව්‍ය ඇස්තමේන්තු පිලියෙල කිරිම, ඇනවුම් කිරිම හා ගබඩා කිරිම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

උපදේශක 17

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 60% |
| සීමිත | 40% |
| කුසලතා | අදාළ නොවේ |

සංලක්ෂ්‍ය :-

උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේදී විවෘත තරඟ විභාගයක් සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව වැඩිම ලකුණු ලැබූ අය පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගැනේ.විවෘත තරඟ විභාගයෙන් බඳවා ගැනීම සඳහා වෙන් කර ඇති 60% තුළ තෝරා ගැනීම සඳහා ප්‍රමාණවත් සංඛ්‍යාවක් සුදුසුකම් නොලැබුවහොත් එම පුරප්පාඩු අභ්‍යන්තර වශයෙන් සුදුසුකම් ලැබූ අයගෙන් වැඩි ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පුරවනු ලැබේ. අභ්‍යන්තර 40% තුළ සුදුසුකම් ලැබූවන් නොසිටියහොත් එම පුරප්පාඩු විවෘත තරඟ විභාගය සමත් වූවන්ගෙන් වැඩි ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පුරවනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,ගණිතය සහ තවත් විෂයයන්දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.(පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව හෝ තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතාවය (N.V.Q.) පහ (05) හෝ හය (06) මට්ටමේ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ පාඨමාලාවක් හදාරා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් කාර්මික ආයතනයක වසර දෙකක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත 7.2.2 හි සහ 7.2.3 හි සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ / වෙබ් අඩවියේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව :අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ලිඛිත හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී වැඩිම ලකුණු ලැබූ අයගෙන් කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගැනේ. (පොරොත්තු ලේඛණ වල තබා බඳවා ගැනීමක් සිදු නොවේ.)

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

(ඇමුණුම 01 බලන්න)

7.2.4.1.1 පවත්වන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| පළපුරුද්ද | 40 | |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය හා පරිගණක හැකියාව | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන කුසලතාවය | 05 | |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 | |
| වෘත්තීය පරීක්ෂණය | 25 | |
| මුළු ලකුණු | 100 | |

සටහන :

(i) ඉහත සඳහන් වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයන් ඇතුලත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීමේ බලධරයා විසින් සිදු කරනු ඇත.

(ii) දේශන පැවැත්වීමේ කුසලතාවය පරීක්ෂා කිරීම සඳහා පහත දැක්වෙන පරිදි වෘත්තීය පරීක්ෂණයක් පැවැත්වේ.

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. දේශන සටහන් පිළියෙළ කිරීම | 07 | 10 |
| 2. ඉදිරිපත් කිරීම | 18 | |
| I. පිවිසුම | 03 | |
| II. දේශන සැලැස්මේ කරුණු සංශිප්තව ඉදිරිපත් කිරීම | 03 | |
| III. ඉදිරිපත් කිරීමේ විලාශය | 05 | |
| IV. විෂයය අන්තර්ගතය | 04 | |
| V. කාල කළමනාකරණය | 03 | |

7.2.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3 සීමිත බඳවා ගැනීම :**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය.

**7.3.2 සුදුසුකම් :**

**7.3.2.1 අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී භාෂාව සහ ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයකින් සමත් වී තිබීම.

**7.3.2.2 වෘත්තීය සුදුසුකම්** : අදාළ නොවේ

**7.3.2.3 පළපුරුද්ද** : දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (උපදේශක) තනතුරේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරියෙකු වීම.

**7.3.2.4 කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**7.3.2.5 වෙනත්** :

i. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
ii. ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.
iii. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iv. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත 7.3.2 හි සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ / වෙබ් අඩවියේ/ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙසතී නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ලිඛිත හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී වැඩිම ලකුණු ලැබූ අයගෙන් කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගැනේ. (පොරොත්තු ලේඛණ වල තබා බඳවා ගැනීමක් සිදු නොවේ.)

7.3.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| කාර්මික දැනුම | 100 | 40 |

(ඇමුණුම 02 බලන්න)

7.3.4.1.1 පවත්වන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| පළපුරුද්ද | 40 | |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය හා පරිගණක හැකියාව | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන කුසලතාවය | 05 | |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 | |
| වෘත්තීය පරීක්ෂණය | 25 | |
| මුළු ලකුණු | 100 | |

(i) ඉහත සඳහන් වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයන් ඇතුලත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

(ii) දේශන පැවැත්වීමේ කුසලතාවය පරීක්ෂා කිරීම සඳහා පහත දැක්වෙන පරිදි වෘත්තීය පරීක්ෂණයක් පැවැත්වේ.

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. දේශන සටහන් පිළියෙළ කිරීම | 07 | 10 |
| 2. ඉදිරිපත් කිරීම | 18 | |
| I. පිවිසුම | 03 | |
| II. දේශන සැලැස්මේ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම | 03 | |
| III. ඉදිරිපත් කිරීමේ විලාශය | 05 | |
| IV. විෂයය අන්තර්ගතය | 04 | |
| V. කාල කළමනාකරණය | 03 | |

7.3.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම හෝ අභ්‍යන්තර නිවේදනයක් මඟින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම් :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව / වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ (ඇමුණුම 03) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස්වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 04) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස්වී වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 05) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද ?

1 වන කාර්යක්ෂමතා කඩඉම :
2 වන කාර්යක්ෂමතා කඩඉම :
3 වන කාර්යක්ෂමතා කඩඉම :
} දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

09. භාෂා ප්‍රවීණතාව :

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 සහ අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම් :

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව,

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය ( 10 ) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය ( 10 ) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය ( 10 ) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05 ) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව,

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය ( 10 ) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය ( 10 ) ක් උපයාගෙන තිබීම.

II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

**10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය** : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කරනු ලැබේ.

**සංලක්ෂය:**

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

**11.** තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි** : අදාළ නොවේ

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

"සක්‍රීය සේවා කාලය " යනු වැටුප් රහිත නිවාඩු කාලයන් අතුලත් නොවන , එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :**

නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (IV) මගින් ලබා දී ඇති 06/2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියලු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වගන්තියේ විධි විධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ එම ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර , එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක වනු ඇත. එසේම වැටුප් පරිවර්තනයේදී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

(i). MN 3 - III ශ්‍රේණිය

(අ) උපදේශක තනතුරට යටත් පිරිසෙයින් අවුරුදු (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධාරීන්,

MN 3 – III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

ii). MN 3 - II ශ්‍රේණිය

(අ) උපදේශක තනතුරක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 20 කට අඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන ඇති නිලධාරීන්,

MN 3 වැටුප් පරිමාණයේ – II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

(iii ). MN 3 - I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි උපදේශක තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 30 කට අඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක විස්ස (20) ක් උපයා ගෙන ඇති නිලධාරීන්,

(ආ) නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මක පැවති සේවා ව්‍යවස්ථාව අනුව MN 1- 2006 A වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබාදී ඇති උපදේශක තනතුරක වැටුප් ලබන නිලධාරීන්,

MN 3 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති දැක්වෙන අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ

සකස් කළේ : අත්සන : ..........................

නම : ..........................

තනතුර : ..........................

දිනය : 2017 .......

R.A.T.C. WEERASEKARA
Administration Officer (Appointment) Coverin
Sri Lanka Railways
Maradana, Colombo - 10.

දිනය : 2017/09/26

පරීක්ෂා කළේ : ..........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ..........................

තනතුර : ජී. ගමගේ
අතිරේක සාමාන්‍යාධිකාරී (පරිපාලන)

දිනය : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : එස්. එම්. අබේසිංහ
තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී
නිල මුද්‍රාව : දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

යොමු අංකය : NT/03/02/04/2

දුම්රිය දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් උපදේශක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..................

නම : ..................

ලේකම්
ජී. එස්. විතානගේ
ලේකම්
.................. අමාත්‍යාංශය
නිල මුද්‍රාව
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා කුසලතා සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශය.
7 වන මහල, සෙත්සිරිපාය (අදියර II)
බත්තරමුල්ල.

දිනය : 2017/10/...

---

යොමු අංකය : PSC/EST/04-01-43/02/2016

දුම්රිය දෙපාර්තමේන්තුවේ හි අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2017.09.12 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..................

නම : ..................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඒ. කුලතුංග
නිල මුද්‍රාව ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ - 05.

දිනය : 2017/10/27

ඇමුණුම 01

01. **විභාගයේ නම :** ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන විවෘත බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගය

02. **විභාග පිළිබඳ විස්තර :**

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

03. **පවත්වනු ලබන බලධරයා :** දුම්රිය සාමාන්‍යාධිකාරී

04. **පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** පුරප්පාඩු ඇති වීම මත තීරණය වේ.

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනුම | අපේක්ෂකයා තුල ඇති ආර්ථික, සාමාජීය , දේශපාලනික, භූගෝලීය හා විද්‍යාත්මක කරුණු පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර මට්ටමෙන් අපේක්ෂකයා තුල ඇති දැනුම පිරික්සීම සඳහා සැකසූ ප්‍රශ්ණ පත්‍රයකි. |
| බුද්ධි පරීක්ෂණය | තර්ක ශක්තිය, තීරණ ගැනීමේ හැකියාව සහ ගණිතමය කුසලතාවය පරීක්ෂා කරනු ලැබේ. |

සටහන 1 : මෙම විභාගය සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පමණක් පැවැත්වෙන අතර අපේක්ෂකයෙකුට කැමති භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකින් පමණි. ස්වකීය අයදුම්පතේ විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

සටහන 2 : ලිඛිත විභාගයෙන් සමත් වන අයදුම්කරුවන්ගෙන් කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර එයින් වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල මත අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. පොරොත්තු ලේඛණවල තබා බඳවා ගැනීමක් සිදු කරනු නොලැබේ.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර : ..........................................

නිල මුද්‍රාව : ..........................................

එම්. අබේවික්‍රම
සාමාන්‍යාධිකාරී
සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

දිනය : 2017.07.26

ඇමුණුම 02

06. විභාගයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන සීමිත බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගය

07. විභාග පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 1/2 | 100 | 40 |
| කාර්මික දැනුම | පැය 02 | 100 | 40 |

08. පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී

09. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇති වීම මත තීරණය වේ.

10. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේෂය |
|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා තුල ඇති ආර්ථික, සාමාජීය , දේශපාලනික, භූගෝලීය හා විද්‍යාත්මක කරුණු පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර මට්ටමෙන් අපේක්ෂකයා තුල ඇති දැනුම පිරික්සීම සහ තර්ක ශක්තිය, තීරණ ගැනීමේ හැකියාව සහ ගණිතමය කුසලතාවය පරීක්ෂා කිරීම සඳහා සැකසූ ප්‍රශ්ණ පත්‍රයකි. |
| කාර්මික දැනුම | සූක්ෂම මිනුම් උපකරන, අගල් සහ මෙට්‍රික් ඒකක පද්ධති, විද්‍යුතය පිළිබඳ මූලික සිද්ධාන්ත , ත්‍රිකෝණමිතිය, වර්ගඵලය ගණනය කිරීම , ගියර සහ පටි එලවුම් පද්ධති, සිවුපහර හා දෙපහර එන්ජින් මූලධර්මය , වායු හා තාප පැස්සුම් පිළිබඳ මූලික දැනුම , සැහිමේ යන්ත්‍ර මූලික දැනුම ආදී පිළිබඳව විස්තරාත්මක දැනුම මැන බලන ආකාරයේ ප්‍රශ්ණ පත්‍රයකි. |

සටහන 1 : ලිඛිත විභාගයෙන් සමත් වන අයැදුම්කරුවන්ගෙන් කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයැදුම්කරුවන් සංඛ්‍යාවක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර එයින් වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල මත අයැදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. පොරොත්තු ලේඛණවල තබා බඳවා ගැනීමක් සිදු කරනු නොලැබේ.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................................

තනතුර : ..........................................

නිල මුද්‍රාව : ..........................................

[illegible]
දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

දිනය : 2014.09.26

01. විභාගයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර : මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විත වේ.

I. ලිඛිත විභාගය

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

II. ප්‍රායෝගික පරීක්ෂණය

| විෂය සීමාව | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්මික අධ්‍යාපනය හා අධ්‍යාපන ක්‍රමවේද භාවිතය | පැය 01 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | <u>ආයතන සංග්‍රහය :</u><br>II වන පරිච්ඡේදය - සේවයට බඳවා ගැනීමේ පරිපාටිය හා පත්කිරීම්<br>III වන පරිච්ඡේදය - මාරු කිරීම්<br>V වන පරිච්ඡේදය - මුදා හැරීම්, කලින් දැරූ තනතුරට පෙරලා යැවීම, සේවය අවසන් කිරීම.<br>VIII වන පරිච්ඡේදය - අතිකාල දීමනා, නිවාඩු දින වැටුප්, සති අන්ත සහ රජයේ නිවාඩු දින වැඩ කිරීම වෙනුවෙන් ගෙවීම්.<br>XII වන පරිච්ඡේදය - නිවාඩු<br>XIII වන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර<br>XIV වන පරිච්ඡේදය - දිවයින ඇතුලත රාජකාරී ගමන්<br>XIX වන පරිච්ඡේදය - රජයේ නිවාස<br>XXVIII වන පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි හා විධි<br>XLVII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය |
| මුදල් රෙගුලාසි | <u>මුදල් රෙගුලාසි</u><br>I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු<br>III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හ උත්තරදායී බව |

| | |
|---|---|
| | IV වන පරිච්ඡේදය - ලැබීම්<br>V වන පරිච්ඡේදය - ගෙවීම් |
| කාර්මික අධ්‍යාපනය හා අධ්‍යාපන ක්‍රමවේදය | අධ්‍යාපනයේ පරමාර්ථ , උපදේශකවරයකුගේ රාජකාරී ස්වභාවය අනුව පුහුණුකටයුතු කිරීමේදී අවශ්‍යවන ප්‍රායෝගික පාඩම් සැලසුම් කිරීම , අත්පත්‍රිකා සුදානම් කිරීම , ගුරු උපදේශන ද්‍රව්‍ය සූදානම් කිරීම, කර්මාන්තශාලා හා පන්ති කාමර ඉගෙනුම් පරිසරය , හදිසි අනතුරු වැලැක්වීම ,රාජකාරී ලැයිස්තුවට අනුව කර්මාන්තශාලා තුල තමාට පැවරී ඇති කාර්යභාරය හා වගකීම් පිලිබඳව දැනුම පරික්ෂා කරන ආකාරයේ ප්‍රායෝගික පරීක්ෂණයකි. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................................

තනතුර : ..........................................

නිල මුද්‍රාව : ..........................................

දිනය : 2017.09.26

01. **විභාගයේ නම :** ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර :** මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත විභාගයකි.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |
| දුම්රිය තාක්ෂණය | පැය 02 | 100 | 40% |

03. **පවත්වනු ලබන බලධරයා :** දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. **පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | XV වන පරිච්ඡේදය - අධ්‍යාපන,අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම.<br>XVI වන පරිච්ඡේදය - නිවාඩු ගමන්.<br>XXIII වන පරිච්ඡේදය - ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙලෙන රජයේ නිලධරයන්ට විශේෂ අනුග්‍රහය සහ ඒ පිළිබඳ කොන්දේසි<br>XXIV වන පරිච්ඡේදය - වැටුප් ණය හා අත්තිකාරම්<br>XX Vවන පරිච්ඡේදය - වෘත්තීය සංගම්වල සාමාජිකයන්ට අනුග්‍රහ<br>XXVII වන පරිච්ඡේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග<br>XXVIII වන පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි හා විධි<br>XLVII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය<br>XLVIIIවන පරිච්ඡේදය- විනය කාර්ය පරිපාටිය |
| මුදල් රෙගුලාසි | IV වන පරිච්ඡේදය - I කොටස - මුදල් භාරගැනීම<br>XIII වන පරිච්ඡේදය - සැපයුම් වැඩ හා සේවා |
| දුම්රිය තාක්ෂණය | දුම්රිය එන්ජින් රියදුරු, නියාමක ආදී මෙහෙයුම් ශ්‍රේණීන්ට හා කාර්මික ශ්‍රේණිවලට කාර්මික පුහුණු පාඨමාලා පැවැත්විය යුතු බැවින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු සියලුම දුම්රිය එන්ජින්වල ක්‍රියාකාරී මූලධර්ම , එන්ජින් නඩත්තු කටයුතු හා දෝෂ හඳුනාගැනීම, විදුලි පද්ධති , ගැල් හා මැදිරි වල නඩත්තු කටයුතු , බොගී සහ තිරාංග පද්ධති ආදිය පිළිබඳව තම තමන්ගේ අංශවලට අදාලවන අයුරින් පුළුල් මට්ටමේ දැනුමක් අපේක්ෂා කෙරේ. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

දිනය : 2017.09.26

නම : ... එම්. අබේවික්‍රම

තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී

නිල මුද්‍රාව : දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, කොළඹ 10.

01. විභාගයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර : මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත විභාගයකි.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ<br>XIV පරිච්ඡේද -දිවයින ඇතුළත රාජකාරි ගමන්<br>XVII පරිච්ඡේද - අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර<br>XXIV පරිච්ඡේද -වැටුප් ණය සහ අත්තිකාරම්<br>XXV පරිච්ඡේද - වෘත්තීය සංගම්වල සාමාජිකයන්ට අනුග්‍රහ<br>XXVI පරිච්ඡේද - නිලධාරීන්ගේ කායික යෝග්‍යතාව පිළිබඳ වෛද්‍ය පරීක්ෂණය සහ වෛද්‍ය උපචාරය<br>XXVII පරිච්ඡේද - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග<br>XXVIII පරිච්ඡේද - පරිපාලන කාර්ය පරිපාටි සහ විධි<br>XXX පරිච්ඡේද - රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XXXIII පරිච්ඡේද - නීති උපදෙස් හා නීති ක්‍රියා මාර්ග<br>XLVII පරිච්ඡේද - සාමාන්‍ය හැසිරීම හා විනය |
| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි<br>I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු<br>V වන පරිච්ඡේදය - ගෙවීම<br>XIII වන පරිච්ඡේදය - සැපයුම් ,වැඩ හා සේවා |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..............................................

තනතුර : ..............................................

නිල මුද්‍රාව : ..............................................

දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

දිනය : 2017.09.26